**ශීර්ෂය - 238 - රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව**

**-----------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 මතය**

**-------**

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 16 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 අගෝස්තු 16 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

**---------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම**

**------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**-----------------------------------------------------**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**----------------------**

**2.1 ආදායම් කළමණාකරනය**

**--------------------------**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ---------------------- | ---------------------------- | ----------- |
| දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට ලක්වන ,ආදායම් සංකේතාංක 1002.10.00 සමාජ වගකීම් බද්ද යටතේ, රු.64,630,699 ක ශේෂයක් හිඟව පැවති අතර, එයින් සමාලෝචිත වර්ෂය තුල රු. 15,838 ක මුදල අය කරගෙන තිබුණු අතර, එය අයකර ගත යුතු මුළු මුදලෙන් සියයට 0.025 ක ප්‍රතිශතයක් විය. | හිඟහිටි ආදායම් වාර්තා අර්ධ වාර්ෂිකව විගණන දෙපාර්තමේන්තුව වෙත නොකඩවා ඉදිරිපත් කර ඇති අතර, කාල විශ්ලේෂණය අනුව එම වාර්තා ලබා දීමට කටයුතු කරන මෙන් දේශිය ආදායම් දෙපාර්තමේන්තුව හා රේගු දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත. එය ලද පසු ඔබ වෙත යොමු කිරීමට කටයුතු කරන අතර මේ සම්බන්ධයෙන් සිහි කැඳවීමක් ද යොමු කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි 128 (ඉ) ප්‍රකාරව හිඟ ආදායම් අප්‍රමාදව රැස් කර ගැනීමේ අවශ්‍යතාවය |

**2.2 වියදම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ මූලධන වියදම් සඳහා රු. 1,700,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණු අතර වර්ෂයේ සත්‍ය වියදම රු. 113,000 ක් වීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරිවීම ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 93 ක් වී තිබුණි. | මූලධන වියදම් හි 93% ක ඉතිරියක් පෙන්නුම් කරනු ලබන්නේ කෝවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් 238-1-1-0-1102 වැය විෂයේ (විදේශීය ගමන්) වියදම් අවම වීම හේතුවෙන්ය. | වාර්ෂික ඇස්තමේන්තු තාත්වික හා ඵලදායි ලෙස සකස් කිරීමේ අවශ්‍යතාවය |
| (ආ) | වැය විෂයයන් 11 ක් සඳහා රු. මිලියන 9.8 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර එයින් රු. මිලියන 4.4 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. ඉතිරිවීම් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 15 ක සිට සියයට 99 දක්වා පරාසයක විය. | සමස්ථයක් වශයෙන් ගත්කළ 90% ක ප්‍රමාණයක් වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් වියදම් දරා ඇත. කෙසේ වෙතත් විශාල වශයෙන් ප්‍රතිපාදන ඉතිරි වී ඇති 238-1-1-0-1102 සහ 238-1-1-1-1302 යන වැය විෂයන්හි දී කෝවිඩ්- 19 වසංගත තත්වය හේතුවෙන් දෙපාර්තමේන්තු නිලධාරින්ගේ විදේශීය පුහුණු සහ සම්මන්ත්‍රණ සඳහා සහභාගීවීම් අත්හිටුවීම සහ අලුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍යතාවක් පැනනොගැනීම මත ප්‍රතිපාදනයන්හි ඉතිරියක් පෙන්නුම් කරයි. | වාර්ෂික ඇස්තමේන්තු තාත්වික හා ඵලදායි ලෙස සකස් කිරීමේ අවශ්‍යතාවය |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම | | |
| **I.**රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක **2/2020** හි **10.1** ඡේදය රාජ්‍ය ගිණුම දෙපාර්ත මේන්තුව විසින් නිකුත් කල මාර්ගෝප දේශ අංක **6** ඡේදය | | මුදල් ප්‍රවාහ ප්‍රකාශය දළ පදනමට සැකසිය යුතු වුවද, එය මුදල් පදනමට සකසා තිබුණි. | | |
| | රු.3,242,277 | i. දෙපාර්තමේන්තු පොත් අනුව වර්ෂය තුල මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදමෙහි වටිනාකම රු.46,420,608 ක් වුවද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි රු.43,178,331 ක් ලෙස දැක්වීම හේතුවෙන් ශුද්ධ මුදල් ප්‍රවාහයෙහි රු.3,242,277 ක වෙනසක් නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තු පොත් අනුව පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම මුදල් ගෙවීම මෙන් හරස් සටහන් මඟින් කරන ලද වියදම් ඇතුළත් වන අතර මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයේ සටහන් වනුයේ මුදල් ගෙවීම් පමණක් වේ. එබැවින් දෙපාර්තමේන්තුව පොත් අනුව ශේෂය හා මූල්‍ය ප්‍රකාශය අනුව ශේෂය සමාන නොවේ. | 2/2020 චක්‍රලේඛ යටතේ නීති රෙගුලාසිවලට අනුකූල නොවීම යටතට මාරුකිරිමට යෝජනා කරමි. |
| | | ii. දෙපාර්තමේන්තු පොත් අනුව ආදායම් නොවන ලැබීම රු.2,201.923 ක් වුවද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි රු.348,493 ක් ලෙස දැක්වීම හේතුවෙන් ශුද්ධ මුදල් ප්‍රවාහයෙහි | ආදායම් නොවන ලැබීම් ලෙස සටහන් වී ඇති රු. 2,201,923 ක මුදල සමන්විතව ඇත්තේ හරස් සටහන් ලැබීම් රු. 2,172,573 ක් සහ භාණ්ඩ වෙන්දේසියෙන් ලද රු. | 2/2020 චක්‍රලේඛ යටතේ නීති රෙගුලාසිවලට අනුකූල නොවීම යටතට මාරුකිරිමට යෝජනා කරමි. |

| | | | |
|---|---|---|---|
| | රු.1,853,430 ක වෙනසක් නිරීක්ෂණය විය. | 29.350 ක්ව මුදලින් වේ. ඒ අනුව මුදලින් ලද ලැබීම් පමණක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන කටයුතු වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ යටතේ දක්වා ඇත. | |
| iii. | දෙපාර්තමේන්තු පොත් අනුව වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම රු.462,685 ක් වුවද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි රු.230,185 ක් ලෙස දැක්වීම හේතුවෙන් ශුද්ධ මුදල් ප්‍රවාහයෙහි රු.232,500 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙම විශ්‍රාම යන දෙපාර්තමේන්තු නිලධාරිනියකගේ ආපදා ණය ශේෂයක් වන අතර එය නිවැරදි ලෙස විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වැය ශීර්ෂයට හර කර දෙපාර්තමේන්තු අත්තිකාරම් බී ගිණුමට බැරකර ඇත. | 2/2020 චක්‍රලේඛ යටතේ නීති රෙගුලාසිවලට අනුකූල නොවීම යටතට මාරුකිරිමට යෝජනා කරමි. |
| iv. | දෙපාර්තමේන්තු පොත් අනුව, අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් පිළිවෙලින් රු. 2,367,195 හා රු. 1,880,986 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි එය පිළිවෙලින් රු 247,500 ක් හා රු. 1,181,946 ක් ලෙස සටහන් කිරීම හේතුවෙන් අත්තිකාරම් ලැබීමෙහි රු.2,119,695 ක වෙනසක් හා අත්තිකාරම් ගෙවීමෙහි රු.699,040 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙම දෙපාර්තමේන්තුව වෙතින් ස්ථානමාරු වී ගිය නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ ණය ශේෂය හරස් සටහන් මඟින් අදාළ ආයතන විසින් පියවීම හේතුවෙන් මෙම අත්තිකාරම් ලැබීම්වල වෙනස ජනිත වේ. | 2/2020 චක්‍රලේඛ යටතේ නීති රෙගුලාසිවලට අනුකූල නොවීම යටතට මාරුකිරිමට යෝජනා කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| | | v. දෙපාර්තමේන්තු පොත් අනුව තැන්පත් ලැබීම හා ගෙවීම රු. 26,367 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි තැන්පත් ලැබීම් ලෙස රු. 9,279 ක් හා ගෙවීම් ලෙස රු.25,242 ක් සටහන් කිරීම හේතුවෙන් තැන්පත් ලැබීම රු.17,088 කින් අඩුවෙන් හා තැන්පත් ගෙවීම රු.1,125 කින් අඩුවෙන් දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ තැන්පතු ලැබීම් හා ගෙවීම් ලෙස සටහන් කර ඇත්තේ මුදලින් ලද ලැබීම හා ගෙවීම් වන අතර භාණ්ඩාගාර ගිණුම් වාර්තා අනුව සටහන් කර ඇත්තේ සියළු තැන්පත් ලැබීම් හා ගෙවීම් (හරස් සටහන් මඟින් කරනු ලබන ගෙවීම් හා ලැබීම් ඇතුළුව) වේ. | 2/2020 චක්‍රලේඛ යටතේ නීති රෙගුලාසිවලට අනුකූල නොවීම යටතට මාරුකිරිමට යෝජනා කරමි. |
| II.මු.රෙ 570 | රු. 41,400 | 2020 දෙසැම්බර් 31 දිනට රු. 41,400 ක් වූ තැන්පතු ගිණුමේ ශේෂය වසර 02 ක කාලයක සිට පැවත එන බැවින්, එම ශේෂය මු.රෙ.570 අනුව, ඉඩම් තැන්පතු හැර තැන්පතු ගිණුමේ වසර 2ට වැඩි කාලයක් පැවති තැන්පතු රාජ්‍ය ආදායමට බැර කලයුතු වුවත් , එසේ කර නොමැති බව නිරීක්ෂණය වීය. | ඔබගේ නිරීක්ෂණය හා එකඟ වේ. එය කාර්යාල පිරිසිදු කිරීමේ ඇප ටෙන්ඩර් තැන්පතු වන අතර වාර්ෂිකව එම තැන්පතු මුදල පොදු තැන්පත් ලේජරයේ ඉදිරියට ගෙනවිත් වාර්ෂිකව වැඩිවීම් පමණක් අදාළ වර්ෂයේ තැන්පත් කිරීම් කර ඇත. 2021 වර්ෂයේ නව ටෙන්ඩර් තැන්පතු සටහන් කිරිමේදි එය නිවැරදි කිරිමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි 570 ප්‍රකාරව කටයුතු කිරීම |

**2.4** බැංකු ගිණුම් මෙහෙයවීම.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ජාතික රක්ෂණ භාර අරමුදල වෙත නිකුත් කරන ලද රු.21,125 ක වටිනාකමින් යුත් චෙක්පත් දෙකක් වසරකට ආසන්න කාලයක් නිකුත් කළත් ඉදිරිපත් නොවූ චෙක් තුල ඉදිරියට එමින් පැවතුණු අතර ඒ සම්බන්ධව මු.රෙ. මු.රෙ.296 හා මු.රෙ.394(ආ) පරිදි කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | ඒ සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. එය ඇමුණුම 2 සහ 3 වශයෙන් මේ සමග ඉදිරිපත් කරමි. | අදාල මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීම |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කාර්යසාධනය**

**3.1.2** **කාර්යභාරයන් ඉටු නොකිරිම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ප්‍රසම්පාදන සැලැස්ම<br><br>2020 වර්ෂය සඳහා රු.1,112,000 ක ඇස්තමේන්තුගත අයවැයක් යටතේ ගෘහ උපකරණ මිලට ගැනීමට ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර තිබුණද, රු.18,000 ක් වටිනා එක් කාර්යාලීය උපකරණයක් පමණක් මිලට ගෙන තිබුණි . | 2020 වර්ෂයේ රටේ පැවති කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් වසරේ වැඩි කාලයක් හුදෙකලා වීම මත ආයතනයන්ගෙන් මිල ගණන් කැඳවීම හා ප්‍රසම්පාදන ක්‍රියාවලින් සිදුකිරිමට අවශ්‍ය කාල වේලාවන් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ප්‍රසසම්පාදන සැලැස්මට අනුව කටයුතු කිරිමට නොහැකි වීමෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන වල සියයට 98 ඉතිරියක් පෙන්නුම් කරයි. | ප්‍රසම්පාදන සැලැස්මෙහි සඳහන් ඉලක්ක නියමිත පරිදි ඉටුකර ගැනීමට කටයුතු කිරීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

### 4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව තුල අනුමත තනතුරු 56 ක් පවතින අතර තථ්‍ය කාර්යමණ්ඩලය අනුයුක්ත කර ඇත්තේ තනතුරු 50 ක් සඳහා පමණක් වන අතර ඒ අනුව තනතුරු 06 ක පුරප්පාඩු පවතින අතර එය අනුමත කාර්යමණ්ඩලයේ සියයට 11 ක ප්‍රතිශතයක් විය. ඒ තුල ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 04 ක් පුරප්පාඩුව පවතින බැවින් එය දෙපාර්තමේන්තුවේ කාර්යසාධන ප්‍රගතිය කෙරෙහි අයහපත් ලෙස බලපෑ හැකි බව නිරීක්ෂණය විය. | නව කාර්යමණ්ඩලය අනුව දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තනතුරු පුරප්පාඩුව මේ වනවිට සම්පූර්ණ වී ඇත. නව කාර්යමණ්ඩලය යටතේ පරිපාලන සේවයේ අනුමත නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ තනතුරු 06 ක් පවතින අතර ඉන් 04 ක් දැනටමත් සම්පූර්ණ වී ඇත. කාර්යාල කාමර ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් මූලික කටයුතු දැනටමත් ආරම්භ කර ඇති බැවින්, කාර්යාල කාමර ඉදිකළ විගස මෙම පුරප්පාඩු පිරවීමට පියවර ගනිමි. | දෙපාර්තමේන්තුවට අනුමත සේවක සංඛ්‍යාව විධිමත් පරිදි පවත්වා ගැනීමට කටයුතු කිරීම. |
| (ආ) | තෘතියික මට්ටමේ භාෂා පරිවර්තක (ඉංග්‍රීසි / සිංහල) තනතුර සඳහා වසර 04 ට ආසන්න කාලයක් පුරප්පාඩුව පවතින බව නිරීක්ෂණය විය. | කාර්යාල කාමර ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් මූලික කටයුතු දැනටමත් ආරම්භ කර ඇති බැවින්, කාර්යාල කාමර ඉදිකළ විගස මෙම පුරප්පාඩු පිරවීමට පියවර ගනිමි. | අවශ්‍යතාවය පරිදි අදාල පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම. |